පුරවැසි ජනමාධ්‍ය
වැඩසටහන
මාධ්‍ය ඒකකය
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

පළමුවන කළාපය
ජූනි - 2007

# vikalpa
# විකල්ප
# மாற்று வழி

# අපට කියන්නට බොහෝ දේ තිබේ...



*පත්තර වල ටී.වී වල යන්නේ නැති අපේ කතා ගොඩක් තියෙනවා*

මාධ්‍ය පුරවැසියන් සඳහා ය. මාධ්‍යයේ ප්‍රථම වගකීම පුැවැසියාටය. මාධ්‍ය වලින් කතා කරන්නේ පුරවැසියන් ගැන ය. පුරවැසියන්ගේ ප්‍රශ්න ගැන ය.

මන්ද යත් ප්‍රජාතනත්‍රවාදයේ පදනම දැනුවත් පුරවැසියා නිසා ය.

මුළු ලෝකයම ගත්විට සමාජයේ සාමාන්‍ය පුරවැසියන් කෙරෙහි වන මාධ්‍යයේ වගකීම සහ යුතුකම පිළිබඳ නිරන්තරයෙන්ම ගැටලු පැන නගිනවා. නිවැරදි බව, පක්ෂපාත බව, සමබර බව, පුළුල් නියෝජනය, මහජන සේවා වටිනාකම්.....ආදී මාධ්‍ය වෙතින් අපේක්ෂිත බොහෝ යහ ගුණාංග වෙතින් දිනෙන් දිනම මාධ්‍යකරුවන් සහ මාධ්‍ය ආයතන ඈත්වෙමින් පවතින බවට චෝදනා නැගෙනවා.

දේශපාලන බල අරගලයේ සහ සංකීර්ණ වෙළඳ තරඟය විසින් මාධ්‍යයේ මහජන සේවා වටිනාකම් අභියෝගයට ලක් කරනවා. වෙනත් වචනයෙන් කියන්නේ නම් දේශපාලනය සහ වානිජකරණය විසින් ජනමාධ්‍ය න්‍යාය පත්‍රය තමන්ට අවශ්‍ය පරිදි ලියමින් සිටිනවා.

### එහි ප්‍රතිඵලය මාධ්‍ය කෙරෙන් පුරවැසියා දුරස් වීම සහ විශ්සනීයත්වය බිඳ වැටීමයි.

පුවත්පත්, රූපවාහිනී, ගුවන් විදුලිය තමයි පුළුල් වශයෙන් මහ ජනතාව වෙත තොරතුරු ගෙනයන ප්‍රධාන මාධ්‍ය ලෙස සැලකෙන්නේ. මේවා එක්තරා විදියකට මහා පරිමාණ මාධ්‍ය කිව්වත් වරදක් නැහැ.

මේ මාධ්‍ය ඇරඹීමටත් පවත්වාගෙන යෑමටත් විශාල ආයෝජනයන් අවශ්‍ය යි. එසේම විශේෂයෙන්ම රූපවාහිනිය සහ ගුවන්විදුලිය ක්‍රියාත්මක වීම සඳහා ඇවැසි තාක්ෂණික යටිතල පහසුකම් විශාලයි. ඒ නිසා බොහෝ රටවල මේ මාධ්‍ය පවත්වාගෙන යාම සඳහා රාජ්‍යයේ හෝ විශාල ව්‍යවසායන්හි සහයෝගය අවශ්‍ය යි. රාජ්‍ය මාධ්‍ය ස්වාධීන මහජන සේවා වශයෙන් පවතින්නේ නැති විට ඒවා හොරණෑ බවට පත් වෙනවා. අනෙක් අතට දැවැන්ත වාණිජ මාධ්‍ය ආයතන වල දේශපාලනමය සහ වාණිජමය වශයෙන් වන ස්වාධීනත්වය පිළිබඳව ද විශාල අර්බුදකාරී තත්ත්වයන් පැන නගිනවා.

මාධ්‍යය විසින් පුරවැසියා නොසලකා හරිනු ලැබීමේ ප්‍රතිඵලයක් හැටියට බිහිවූ නොයෙකුත් විකල්පයන් පිළිබඳව අප දන්නවා. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය විසින් අමතක කර දමන නොයෙකුත් ආන්තික ප්‍රජා කණ්ඩායම් වල හඬ නියෝජනය සඳහා ඇරඹී ඇති නොයෙකුත් ප්‍රජා මාධ්‍ය මේ අතරෙන් ප්‍රධානයි. (ප්‍රජා ගුවන් විදුලි, ප්‍රජා පුවත්පත්, සඟරා)

ලෝකයේ ඇතැම් රටවල ප්‍රජාමාධ්‍ය සාමාන්‍ය පුරවැසියන් වෙනුවෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනවා.

කෙසේ වෙතත් අප රටේ එවැනි සාර්ථක ප්‍රජා මාධ්‍ය සංස්කෘතියක් ඇත්තේ ද නැහැ. නොයෙකුත් දේශපාලන කඹ ඇදිලි සහ රජයේ අකාර්යක්ෂමතාව නිසා අතරමග අඩපණ වූ උත්සාහයන් ගණනාවක් තිබෙනවා.

නමුත් ධෛර්යයට කාරණයක් තමයි, කොළඹින් බැහැර අතැම් ප්‍රදේශවල පුරවැසි කණ්ඩායම් අතලොස්සක් හෝ ස්වෙච්ඡාවෙන් වැඩ කරමින්, පුරවැසි කේන්ද්‍රීය පුවත්පත්, ප්‍රජා දැන්වීම් පුවරු ආදී මාධ්‍යයන් පවත්වාගෙන යාමට උත්සහ කිරීම.

මේ නිසා ''අතරමැදියෙකු''ගේ එනම් ජනමාධ්‍යවේදින්ගේ සේවාව ලබා නොගෙන තමන්ට කියන්නට ඇති දේ ඍජු ව කියන්නට ඉඩක් දැන් පුරවැසියන්ට විවෘතව තිබෙනවා. එමගින් පුරවැසියන් ජනමාධ්‍යවේදීන් බවට පත් වෙනවා. එය ලෝකයේ ඉතාමත්ම වේගයෙන් පැතිරෙමින් තිබෙනවා.

### ඒ තමයි පුරවැසි ජනමාධ්‍ය

අන්තර්ජාලය හරහා ක්‍රියාත්මක වෙන පුරවැසි ජනමාධ්‍ය භාවිතය වත්මන් ලෝකයේ බොහෝ රටවල පැතිර තියෙනවා. ශ්‍රී ලංකාවේ තවමත් මෙය පවතින්නේ එක්තරා විදියක ආගන්තුක මාධ්‍යයක් හැටියට. අන්තර්ජාලය භාවිතය සඳහා ඇති සම්පත් සහ අවබෝධය මඳකමත්, ඒ සඳහා උනන්දු කිරීමක් සහ දැනුවත් කිරීමක් පුළුල් වශයෙන් සිදු නොවීමත් මීට හේතුවයි.

සමහර විට ප්‍රධානතම ප්‍රශ්නය වන්නේ අන්තර් ජාල සබඳතා රට පුරා නැති වීම සහ සිංහල බසින් ඊමේල් හුවමාරුවට සහ වෙබ් අඩවි පවත්වාගෙන යෑමට ඇති දුෂ්කරතාවය යි.

මේ දුෂ්කර තත්වයන් හඳුනා ගත් විට ඒවා ජය ගැනීම ගැනත් අපට කල්පනා කරන්න පුලුවන්.

මාධ්‍ය කෙරෙහි සිවිල් සමාජයේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් අප පසුගිය වසරේ පැවැත් වූ බව ඔබට මතක ඇති. එය ඉදිරියට ගෙන යාමක් ලෙස අප දැන් අලුත් වැඩකට අත පොවන්න අපේක්ෂා කරනවා. ඒ පුරවැසි ජනමාධ්‍ය වැඩසටහනක්. එතුළින් අප උත්සහ කරන්නේ මේ අඩු පාඩු සහ දුෂ්කරතා යම් දුරකට හෝ පුරවාලීමටයි. හඬක් නැති ප්‍රජාවන්ට කතා කිරීමට මාර්ගයක් විවර කර දීමටයි.

### පුරවැසි ජනමාධ්‍ය ක්‍රියාත්මක වෙන්නේ කොහොමද?

පුරවැසි ජනමාධ්‍ය කියන්නෙ පුරවැසියන් විසින්ම තමන්ගේ තොරතුරු අදහස්, මතවාද කිසියම් මාධ්‍යයක පළකිරීමයි. මේ මාධ්‍ය අන්තර්ජාලය විය යුතු නෑ. නමුත් අනෙක් මාධ්‍යවලට නැති ප්‍රායෝගික වාසි කීපයක්ම අන්තර්ජාලය භාවිතා කිරීමේ තිබෙනවා.

- කිසිදු ආයොජනයකින් තොරව ඕනෑම පුරවැසියෙකුට මේ මාධ්‍ය



*අපේ කතා අපේ හඬින්*



බුද්ධික වීරසිංහ

නෑසෙන හඬට හඬක්...

හරහා තමන්ගේ අදහස් පළ කළ හැකියි.

- වෙනත් කිසිදු මාධ්‍යයකින් ප්‍රවේශ විය නොහැකි තරම් පිරිසක් වෙතට තම පණිවුඩය ගෙන යා හැකියි. එනම් දේශ සීමා, මායිම් නැත.
- තොරතුරු පළ කරන්නන්ගේ අනන්‍යතාව පාඨකයින් කෙරෙන් රහසක් ලෙස තබා ගත හැකියි.
- ඉතා කඩිනමින් උත්තර/ ප්‍රතිචාර ලැබිය හැකියි. මේ නිසාම අදාළ කාරණය පිළිබඳ විවිධ දිශානතීන් ඔස්සේ පුළුල් සාකච්ඡාවකට එළඹිය හැකියි.
- අනෙකුත් මාධ්‍ය වලට සාපේක්ෂව ආණ්ඩුවේ හෝ වෙනත් බලපෑම් විසින් යටපත් කර දැමීමට දුෂ්කරයි.
- පූර්ව සුදුසුකම් අවශ්‍ය නැත. නිශ්චිත ශාස්ත්‍රීය ප්‍රමිතියකට ලිවිය යුතු නොවේ. ඕනෑම අයෙකුට සමාජයට හානි නොවන පරිදි තම අදහස පළ කල හැකියි.

## පුරවැසි ජනමාධ්‍ය ගැන ඇති වැරදි වැටහීම් කීපයක්

***පරිගණක නැතිව, අන්තර්ජාල පහසුකම් නැතිව මොන පුරවැසි ජනමාධ්‍යයද?***

**ඇත්ත-** පුරවැසි ජනමාධ්‍ය මූලික වශයෙන් පදනම් වෙන්නේ අන්තර්ජාල මාධ්‍ය මත තමයි. නමුත් මේ පහසුකම් නැති, නමුත් ලියන්නට දේවල් කැකෑරෙන, ඒවා ලියා පළ කර ගන්නට තැනක් නැති ඕනෑම කෙනෙකුට තමන්ගේ ලිපි, ප්‍රවෘත්ති, පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවි පවත්වාගෙන යන ආයතනයකට හෝ පුද්ගලයෙකුට බාර දිය හැකියි. ලංකාවේ දැනට මෙවැනි පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවි කීපයක්ම තිබෙනවා.

***ඉංග්‍රීසි භාෂාවෙන් විතරයිනෙ ඔය හැමදේම කරන්න පුළුවන්.***

**ඇත්ත-** ඉංග්‍රීසි භාෂාව අන්තර්ජාතික භාෂාවක් නිසා එහි පාඨක පිරිස ලොව පුරාම සිටිනවා. ඒක වාසියක්. නමුත් සිංහල සහ දෙමළ භාෂාවෙන් ලිවිය හැකි පුරවැසි මාධ්‍ය වෙබ් අඩවි දැන් තිබෙනවා. groundviews එවැන්නක්. (www.groundviews.org) අපගේ මෙම වැඩසටහන යටතේ අපි තවත් ත්‍රෛභාෂික පුරවැසි මාධ්‍ය වෙබ් අඩවියක් ආරම්භ කර තිබෙනවා. ඒ තමයි ***විකල්ප (www.vikalpa.org)*** ඒ පිළිබඳ සියලු විස්තර අපේ ඊළඟ කලාපයේ ඇතුළත් වේවි.

ඒ නිසා ඔබට යමක් කීමට ඇත්නම් භාෂාව හෝ තාක්ෂණය තවදුරටත් බාධාවක් වෙන්නේ නෑ.

**අපේ වැඩසටහනින් මොනවද කරන්න යන්නෙ?**

- තෝරාගත් ප්‍රදේශ ගණනාවක ක්‍රියාකාරී සිවිල් වැසියන් කණ්ඩායමකට පුරවැසි ජනමාධ්‍ය භාවිතය පිළිබඳව අවබෝධයක් ලබා දීම.
- පුරවැසි ජනමාධ්‍යයේ ප්‍රායෝගිකව යෙදීමට ඔවුන්ව උනන්දු කරවීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් හැකි පමණින් ලබා දීම.
- පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවියක් ආරම්භ කිරීම සහ එයටත් අනෙකුත් පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවි වලටත් නිරන්තරයෙන් ලිපි ලියන උද්යෝගිමත් කණ්ඩායමක් බිහි කිරීදීම.
- අවසාන වශයෙන් සාමාන්‍ය පුරවැසියන්ට තම අදහස් නොවළහා පළ කළ හැකි මාධ්‍යයක් ලෙස පුරවැසි ජනමාධ්‍ය භාවිතය ලංකාවේ ප්‍රචලිත කිරීම සහ ඒ හරහා සමස්ත ජනමාධ්‍ය ක්ෂේත්‍රයට දැනෙන බලපෑමක් කිරීම.

පුරවැසි ජනමාධ්‍ය වැඩසටහන
මාධ්‍ය ඒකකය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
1 සී, 28 වෙනි පටුමග, මල් පාර, කොළඹ - 07
දුරකථන අංක : 011-2375269, 011-2375012
ෆැක්ස් අංකය : 011-2375623

**විකල්ප වෙබ් අඩවිය සමග සම්බන්ධ විය හැකි විද්‍යුත් තැපැල් ලිපිනයන්**

contributions@vikalpa.org
editor@vikalpa.org
info@vikalpa.org

# www.vikalpa.org

## 'විකල්ප" පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවියට ඔබත් ලියන්න

"විකල්ප'' නමින් ත්‍රෛභාෂික පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවියක් අප මේ වැඩසටහන යටතේ ආරම්භ කර තිබෙනවා.

**www.vikalpa.org** එහි වෙබ් ලිපිනය.

මානව හිමිකම්, සාමය, ප්‍රජාතන්ත්‍රවාදය, ආණ්ඩුකරණය, යුද්ධය,සාමය....ආදී කවර හෝ ක්ෂේත්‍රයකට අදාලව ඔබට සමාජයේ අනෙක් පුරවැසියන් සමග බෙදා ගත යුතුයැයි සිතෙන,ඔවුන් දැනුවත් කළ යුතු යැයි සිතෙන, සිදුවීම් සහ අදහස් ඉදිරිපත් කිරීම් සිංහල හෝ දෙමළ භාෂාවෙන් විකල්ප වෙබ් අඩවියට ලියන්න. නැතිනම් ඔබේ ලිපිය අප වෙත එවන්න.

**පුරවැසි ජනමාධ්‍ය පිළිබඳ වැඩි තොරතුරු සමගින් ඊළඟ කලාපයේදී හමුවෙමු.**

## පුරවැසි ජනමාධ්‍ය වෙබ් අඩවි කිහිපයක්

### සිංහල / දෙමළ භාවිත වෙන වෙබ් අඩවි

Groundviews
www.groundviews.lk
Kottu
www.kottu.org
Sinhala blogs
http:sinhalablogs.coconia.net
VOR Radio
http:/radio.
voicesofpeace.lk

### ජාත්‍යන්තර වෙබ් අඩවි

http://www.bbc.co.uk/dna/ican

http://www.current.tv
http://newsvine.com

http://English.ohmynews.com
http://parmedia.org

Centre for Citizen Media
http://citmedia.org/

Principles of Citizen Journalism
http://www.citmedia.org/principles

The Largemouth Citizen Journalism Manual

http://www.mcgillreport.org/largemouth.htm